පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 07 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **ක්‍රිස්තියානි ධර්මය**

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ...........................  කාලය : පැය 02

## I කොටස

- **(සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.)**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) " දෙවි සමිඳාණන් වහන්සේ පූර්ව දිශාවේ ඒදන් උයනක් තනා තමන් මැවූ ..................
එහි පිහිටෙවූ සේක" හිස්තැන පුරවන්න.
i) සත්ත්වයා ii) මනුෂ්‍යයා iii) මැවිල්ල

02) චක්‍රාකාර දේව නිමැවුමකි.
i) මුහුදු රළ ඇතිවීම. ii) තද සුළං හමා අකුණු ඇතිවීම.
iii) සෘතු භේදය ඇතිවීම.

03) දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය තුළ අප ලබන වරප්‍රසාදයකි,
i) යුක්තිගරුක සාධාරණ ජීවිතයක්. ii) සියලු පාපයෙන් මුදන ජීවිතයක්.
iii) ඉහත පිළිතුරු සියල්ලම.

04) මැවිල්ල සම්බන්ධව දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට පැවරූ වගකීමක් නොවන්නේ,
i) මැවිල්ල ආරක්ෂා කිරීම.
ii) මැවිල්ලේ අයිතිකරු වීම.
iii) මැවිල්ල වර්ධනය කිරීම.

05) ජෝබ් 28: 28 ට අනුව, දේව ගරුබිය පෑම යනු,
i) යහපතේ උල්පතයි. ii) ආදරයේ උල්පතයි. iii) ප්‍රඥාවේ උල්පතයි.

06) " මට පසුව එන තැනැත්තේ මට වඩා බල සම්පන්නය. මම උන්වහන්සේගේ පාවහන්වල පටිය මුදන්නටවත් නොවටිමි" මෙම ප්‍රකාශය තුළින් විදහා දැක්වෙනුයේ,
i) නිහතමානිකමයි. ii) ප්‍රේමයයි. iii) දයාවයි.

07) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා අතුරින්, උන්වහන්සේගේ බලය පෙන්වන ලෙස බලපෑම් කල පරීක්ෂාව වූයේ,
i) කුරුසියේ පූජා වීම.
ii) යක්ෂයාට නමස්කාර කිරීම.
iii) දේවමාලිගාවේ කොත මුදුනේ සිට බිමට පැනීම

08) ගෙත්සෙමනේ උයනේ යාච්ඤා කිරීම සඳහා ජේසුතුමා තෝරාගත් ගෝලයන් තිදෙනා වූයේ,

i) අන්ඩෘෘ, ජොහාන්, පේදුරු    ii මතෙව්, තෝමස්, පේදුරු

iii) පේදුරු,ජොහාන්,ජාකොබ්

09) ජේසුස් වහන්සේ සිය මෙහෙය සම්පූර්ණයෙන්ම සාර්ථක ලෙසින් කළ බව, කුරුසියේ කළ කුමන ප්‍රකාශයෙන් පෙන්වීද?

i) ස්ත්‍රිය මෙන්න නුඹේ පුත්‍රයා,මෙන්න නුඹේ මෑණියෝ

ii) පියාණෙනි , ඔවුන්ට කමාවූව මැනව....

iii) සියල්ල නිම විය.

10) ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කල ප්‍රථම ශ්‍රාවකයා වූයේ,

i) තෝමස්    ii) ලෙවි    iii) පේදුරු

(ලකුණු 2 x10 = 20 )

❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| 11) | ශුද්ධාත්මයාණන්ගේ දිරිය ලබා ඇදහිල්ලෙන් හා දේව බලයෙන් යුතුව සාක්ෂි දරණ සමූහය. | 39 කි. |
| 12) | මේරි ජෝන්ට බයිබලයක් මිලදී ගැනිමට අවු : ........... ක් මුදල් එකතු කළාය. | වාචික |
| 13) | පැරණි ගිවිසුමේ පොත් සංඛ්‍යාව | 40 ක් |
| 14 ) | ජේසුස් වහන්සේ පාළුකරයේ ගත කළ දින ගණන | 7 ක් |
| 15 ) | මුඛ පරම්පරාවෙන් පැවත ගෙන එන සම්ප්‍රදාය | සිනගෝගය |
| | | සභාව |

(ලකුණු 2 x 5 = 10)

❖ වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

16) පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද, .................................... ද සොයන්න.

17) මා නුඹට කී සියලු වචන ...................................................................... ලියන්න.

18) ඔබ ................................................ පෙර ඔබේ වුවමනා කවරේදැයි පියාණන් වහන්සේ දන්නා සේක.

19) ශුද්ධ බයිබලයේ ග්‍රී පිටපත හඳුන්වන්නේ ............................................. ලෙසය.

20) යමෙකු දේව රාජ්‍යය .................................................. සේ පිළි නොගතහොත් ඔහු කිසිදිනෙක එහි ඇතුළු නොවන්නේ ය."

**( සෙප්තුවාජින්ත/ ධර්මිෂ්ඨකම/ ඉල්ලන්නටත්/ පොතක/ ළදරුවෙකු)**

(ලකුණු 2 x5 = 10 )

**

## II කොටස

❖ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01)

I. බිබ්ලිය යන්නෙහි අර්ථය කුමක්ද?

II. ස්නාවක ජොහාන්තුමාගේ ආහාරය කුමක්ද?

III. මැවිල්ල කෙරේ ඔබේ වගකීම් 02 ක් ලියන්න.

IV. ජේසුතුමා ප්‍රේමකල ශ්‍රාවකයා වූයේ,

V. පේදුරුතුමා හා ජොහාන්තුමා කල පළමු සුව කිරිම වන්නේ,

VI. මුල් සභාවේ ලක්ෂණ 02 ලියන්න.

VII. ජේසුතුමා කුරුසියේ පැවසූ වදන් 02 ක් ලියන්න.

VIII. බැටළුවා හා එඬේරා හඳුන්වන්න.

IX. ජේසුතුමා ජනතාවට ඉගැන්විමට තෝරාගත් ස්ථාන 02 ලියන්න.

X. ජේසුතුමා ඉගැන්වූ උපමා 2 ක් ලියන්න.

(ලකුණු 2 x10 = 20 )

02).

I. වත්මන් සමාජය තුළ ළමා අයිතීන් සුරැකීම උදෙසා දායකවන ආයතන 2 ක් නම් කරන්න. (ලකුණු . 02)

II. දරුවන් පිළිබඳ ශුද්ධ බයිබලයේ සඳහන් පාඨයක් ලියන්න. (ලකුණු . 03)

III. අද සමාජය තුල දරුවන්ට ඇති පීඩාවන් 05 ක් නම්කරන්න. (ලකුණු . 05)

03.)

I. ජුදෙව් පාස්කු මංගල්‍යය දිනය යනු කුමක් ද? (ලකුණු . 02)

II. ශුද්ධාත්මයාණන් වහන්සේ මෙලොවට පැමිණි දිනයේ සිදු වූ විශේෂ සිද්ධීන් 03 ක් ලියන්න. (ලකුණු . 03)

III. අප හටද ශුද්ධාත්ම මඟ පෙන්විම හා දිමනා ඉල්ලා යාච්ඤාවක් ලියන්න. (ලකුණු . 05)

04.)

I. ශ්‍රාවකයන්ගේ පාද සේදිම තුලින් ජේසුස් වහන්සේ පෙන්වා දුන් ආදර්ශයන් 02 ලියන්න. (ලකුණු . 02)

II. එදිනෙදා ජීවිතයේ ඔබ මුහුණ දෙන අභියෝග 03 ක් ලියන්න. (ලකුණු . 03)

III. ජේසුස් වහන්සේගේ කුරුසි පූජාවට පෙර සිදු වූ විශේෂ සිදුවිම් අතුරින් ඔබට වඩාත් සමීප වූ සිදුවිම වාක්‍ය 05 කින් ලියන්න. (ලකුණු . 05)

05.)

I. ඔබට ලැබී ඇති, අන් අය වෙනුවෙන් වැය කල හැකි විශේෂ හැකියාවන් 02 ලියන්න. (ලකුණු . 02)

II. සමාජයේ පිළිගැනීමට ලක් නොවන අය වෙනුවෙන් ඔබට කල හැකි දේවල් 03 ලියන්න. (ලකුණු . 03)

III. දේව වචනය ලිවීමෙන් ලැබුණු විශේෂ ප්‍රයෝජන 05 ක් ලියන්න. (ලකුණු . 05)

06)

I. ශ්‍රී ලංකාවේ වෙනත් ආගම් 02 ක් නම් කර ඒවායේ ප්‍රධාන ග්‍රන්ථ නම් කරන්න. (ලකුණු . 02)

II. විවිධ ආගමික උත්සව සඳහා ඔබට දායක විය හැකි ආකාර 03 ක් ලියන්න. (ලකුණු . 03)

III. ශ්‍රී ලංකාවේ කිතු දහම හැර අන් ආගමක් පිළිබඳ කරුණු 05 ක් ලියන්න. (ලකුණු . 05)

***

# 7 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

## I කොටස

01.) මනුෂ්‍යයා
02.) සෘතුභේදය ඇතිවීම.
03.) මෙම පිළිතුරු සියල්ලම.
04.) මැවිල්ලේ අයිතිකරුවීම.
05.) ප්‍රඥාවේ උල්පතයි.
06.) නිහතමානිකමයි.
07.) යක්ෂයාට නමස්කාර කිරීම.
08.) පේදුරු , ජොහාන්, ජාකොබ්
09.) සියල්ලම නිම විය.
10.) තෝමස්
11.) සභාව
12.) අවුරුදු 07 ක්
13.) 39 කි.
14.) 40 ක්.
15.) වාචික.
16.) ධර්මිෂ්ඨකමට
17.) පොතක
18.) ඉල්ලන්ටත්
19.) සෙප්තුවාජින්ත
20.) ළදරුවෙකු

## II කොටස

01.)

I. පොත්
II. පළගැටියන්
III. වර්ධනය කිරීම, පාලනය කිරීම
IV. ජොහාන්
V. සුදර්ශන දොරටුව අසල සිටි කොර මිනිසා සුව කිරීම.
VI. ඉගැන්වීම, සහභාගිකම, රොටිකැඩීම, යාච්ඤාව, සියල්ල පොදුවේ තබා ගැනීම. (ඕනෑම පිළිතුරු 02 ක්)
VII. පියාණෙනි ඔවුන්ට කමාවුව මැනව..............., ස්ත්‍රිය මෙන්න නුඹේ පුත්‍රයා ............... සියල්ල නිමා විය.
VIII. බැටළුවා - කිතුනු අප - එඬේරා - ජේසුස් වහන්සේ
IX. කඳු මුදුන. මුහුදු වෙරළ, තැනිතලා බිම
X. නැති වූ බැටළුවා පිළිබඳ උපමාව , රන්කාසි දසය පිළිබඳ උපමාව.

02.)

I. ◆ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය.
◆ ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යංශය
◆ පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව.

II. " මා කෙරෙහි අදහාගත් මේ බාලයන්ගෙන් එකතුවත් නොමඟ යවන යමෙක් වේද, ඔහුගේ ගෙල වටා මහා ඇඹරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත "
(ශු.මතෙව් 18:6)

III. ◆ දුප්පත්කම නිසා ඇතිවන බලපෑම.
◆ විවිධ හිංසනවලට ගොදුරු විම.
◆ මව පියා විදේශ ගත වීම නිසා ඇතිවන බලපෑම.
◆ යුද්ධයෙහි අනිසිවිපාක.
◆ දෙමාපිය සබඳතා දෙදරා යාම.

03.)

I. ජුදා පෙන්තකොස්ත මංගල්‍යා.

II. ◆ සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක්
◆ ගිණි දළු වැනි දිව්. - රැස්ව සිටි අය මත පිහිටවනු ලැබිම.
◆ අන්‍ය භාෂා වලින් කතා කිරිම.

III. දරුවා ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

04)

I. ◆ නිහතමානීව සේවය කිරිමේ අගය
◆ දෙවියන් වහන්සේ උස්පහත්කම් නොසලකන බව.
◆අර්ථවත් මෙහෙවරක් උදෙසා ස්වාමියා දාසයෙකු මෙන් ක්‍රියාකළ යුතු බව.

II. දරුවා ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

III. ◆ අන්තිම රාත්‍රී භෝජනය - ශ්‍රාවකයන්ගේ පාද සේදිම
◆ ගෙත් සෙමනේ යාච්ඤාව .
ඉහත සඳහන් සිද්ධි 02 න් එකක් තෝරා වාක්‍ය 05 ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06 )

I. ◆ බෞද්ධ දර්ශනය - ත්‍රිපිටකය
◆ හින්දු ආගම - වේද ග්‍රන්ථය
◆ ඉස්ලාම් ආගම - කුරාණය

II. ◆ විවිධ ආගමික උත්සව වලදි එම කිතුණු අනන්‍යතාවය රැකෙන පරිදි කටයුතු කිරිම.
◆ අන් ආගම් වලට ගරු කරමින් සෙසු ආගම් සමඟ සහජීවනයෙන් කටයුතු කිරිම.

III. 21 වන පාඩමට අනුව විවිධ ආගම් 03 ට අනුව ලියා ඇති කරුණු සලකා බලයි.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න